# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,590 — 1958 නොවැම්බර් 21 වැනි සිකුරාදා—21.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 2607 | තොටුපළ් ඡේත්ද හා වෙනත් ඡේත්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 2612 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 2612 | රට බිම් විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 2621 | විවිධ දැන්වීම් — | 2622 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායඝී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරු වලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙනොත්, එසේ තනතුරු වලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ පටන් ගැන්මේ පළ කර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

එස්. එෆ්. ද සිල්වා,
අධ්‍යාපනාධ්‍යක්ෂ.

අංකය : ඒ. බී. බී. 3184.
1958 නොවැම්බර් මස 15 වැනි දින,

කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

---

## ආදර්ශ ෆෝරමය

### I වැනි ශ්‍රේණියේ පාඨශාලා පරීක්ෂක තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රය

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලිපිනය :————.
(සියලුම ලියුම් ආදිය මේ ලිපිනයට යවනු ලැබේ.)

(3) (අ) විවාහකද යන වග :————.
(ආ) එසේ නම්, භාර්යාවගේ/පුරුෂයාගේ නම හා රක්ෂාවේ විස්තරය :————.

(4) (i) ඉල්ලුම්කරු උපන් දිනය හා ස්ථානය :————.
(ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු ය. දැන්වීමේ 5 (i) ඡේදය බලන්න.)
(ii) ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ස්ථානය : ————.
(iii) ඉල්ලුම්කරුගේ පියාගේ පියා උපන් ස්ථානය : ————.
(iv) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා උපන් ස්ථානය :————.

(5) (අ) ඉල්ලුම්කරු ගේ ජාතිය :————.
(ආ) ලාංකිකයකු නම්, ලියාපදිංචි කිරීමෙන් හෝ පරම්පරාවෙන් ද යන වග :————.

(6) (අ) දැනට නියුක්ත රක්ෂාව හා එහි විස්තර :————.
(ආ) ශික්ෂකයකු නම් ලියාපදිංචි කළ අංකය හා දැනට ලබන වාර්ෂික වැටුප :————.

(7) ශාස්ත්‍රීය සුදුසුකම් :—
(සහතික පත්‍ර පිටපත් ඇමිණිය යුතු ය.)
(අ) උපාධියේ නම :————.
(ආ) විශ්ව විද්‍යාලය :————.
(ඉ) සූචි අංකය :————.
(ඊ) වර්ෂය :————.
(උ) විෂයයෝ :————.
(ඌ) බාහිරද අභ්‍යන්තර ද යන වග :————.

(8) වෘත්තීය සුදුසුකම් (පුහුණුව ලැබූ ස්ථානය හා කාලපරිච්ඡේදය සඳහන් කළ යුතුය.) (ලබාගත් සහතික පත්‍රවල පිටපත් මීට සාක්ෂි වශයෙන් ඇමිණිය යුතු යි).

(9) (අ) සිංහල දැනුම :————.
(ආ) දෙමළ දැනුම :————.
(දැන්වීමේ 5 (iv) ඡේදය බලන්න).

(10) ඉගැන්වීමේ පළපුරුද්ද (පාඨශාලාවල නම් හා ඒ පාඨශාලාවේ ඉගැන්නූ කාලපරිච්ඡේදය දින සමඟ සඳහන් කරන්න.)

| පාඨශාලාවේ නම | බැඳුණු දිනය | අස්වූ දිනය | සේවා කාලය | අස්වීමට හේතුව, ස්ථාන මාරුකොට යැවීමද, ඉල්ලා අස්වීමද, සේවය නැවැත්වීමද, සේවයෙන් පහ කිරීම ද යන වග |
|---|---|---|---|---|
| | | | | |

(11) යුද්ධ සේවා සටහන,:————.
(අස්වී යෑමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතු යි.)

(12) සහතික දෙන අයගේ නම් :————.
(සහතික තුනකට වැඩි නො වන ගණනක පිටපත් ඇමිණිය යුතු යි.)

(13) අන්‍ය සුදුසුකම් :————.

————,
අත්සන.

දිනය :————.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව—ප්‍රකාශන අංශය

### භාෂා පරිවර්තක තනතුරු

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශයට සිංහල භාෂා පරිවර්තකයෙක් සහ දෙමළ භාෂා පරිවර්තකයෙක් පත්කර ගැනීම සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මේ සඳහා එවන අයදුම් පත් පහත සඳහන් ආකෘතියට අනුව සම්පූර්ණ කර 1958 දෙසැම්බර් මස 6 වැනි දිනට ප්‍රථම මෙම කාර්යාලයට එවිය යුතු යි.

2. **වේතනය හා සේවා කොන්දේසි.**—මේ තනතුරේ වාර්ෂික පඩිය රුපියල් 3,900න් පටන් ගෙන වසකට රුපියල් 180වේ හා රුපියල් 240හේ වැඩිවීම් ඇතිව රුපියල් 6,540 දක්වා නගී. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිය. මේ තනතුරු සඳහා තෝරා ගනු ලැබූවන් පත් කරනු ලබන්නේ තුන් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ පරීක්ෂාවට යටත් කොටය.

3. **අවශ්‍ය සුදුසුකම්.**—1. සෑම අයදුම් කරුවෙකුම,

(අ) වර්ෂ 1958 දෙසැම්බර් මස 6 වැනි දිනට වයස අවුරුදු 25ට නොඅඩුවූද, 45ට නොවැඩිවූද අයකු විය යුතු යි. (දැනට රජයේ සේවයෙහි නියුක්තවූවන්ට මේ වයස් සීමාව බල පාන්නේ නැත).

(ආ) සිංහල භාෂා පරිවර්තක තනතුරු සඳහා නම් අයදුම් කරුවන් සිංහල භාෂාව සම්බන්ධයෙන් විශිෂ්ඨ දැනීමක් ඇත්තන් විය යුතු යි. දෙමළ භාෂා පරිවර්තක තනතුරු සඳහා නම් දෙමළ භාෂාව පිළිබඳ විශිෂ්ඨ දැනීමක් ඇත්තන් විය යුතුයි.

(ඉ) කලා හෝ විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලැබූවකු විය යුතු යි. නැත හොත්,

(i) පරිවර්තක කටයුතු සම්බන්ධව මනා අභ්‍යාසයක් හා හැකියාවක් ඇති බව පෙන්නුම් කිරීමට තරම් සෑහෙන තමා විසින් ම ලියන ලද රචනා හෝ පරිවර්තන හෝ ඉදිරිපත් කළ හැකි තැනැත්තකු විය යුතුයි.

(ඊ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත විය යුතුයි.

4. (අ) පහත සඳහන් සහතික පත්වල පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි—

(i) උප්පැන්න සහතිකයක්. (බවුතිස්ම සහතික පත් හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කටයුතු සඳහා නිකුත් කරන ලද සහතික පත් හෝ භාර ගනු නො ලැබේ).

(ii) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් හා/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳව ලැබූ සහතික පත්‍ර.

(iii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මේ තනතුරට ඇති යෝග්‍යතාව සම්බන්ධයෙන් මෑතකදී ලබා ගන්නා ලද සහතික පත් 3ක්. (දැනට රජයේ සේවය කරන්නන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ).

(ආ) තමා විසින් කර ඇති පරිවර්තන හෝ වෙනත් රචනා සම්බන්ධයෙන් විස්තර සඳහන් කළ යුතුයි. (මේවා සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම්ව තිබිය යුතු යි).

5 අයදුම් පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම්කියුම් මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට නොව "රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් තුමා, තැ. පෙ. 520, කොළඹ" කියා එවිය යුතුයි.

6. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළමුවන කොටසේ දෙවන ඡේදයේ පළවූ රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳව පොදු කොන්දේසි බලනු මැනවි.

7. දැනට රජයේ සේවයේ නියුක්ත අය විසින් එවන ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතුයි. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර භාර ගනු ලබන්නේ ඒවා තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයන්ට නියමිත දිනට ප්‍රථම භාරදී තිබී ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස හේතු සහිතව නිර්දේශ කළ හොත් පමණකි.

8. සෑම අයදුම් පතක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. අයදුම් පත් භාර ගැනීම නවත්වා තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම් කරුවකුට නො ලැබුන හොත් ඔහු විසින් වහාම ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ විශේෂ කොමසාරිස් තැනට පළමු කී ලිපිනයට දැන්විය යුතු යි. ඔහු මෙසේ නො කළ හොත් ඔහුගේ එම අයදුම් පත ගැන සලකාබැලීමට ඇති යුතුකම් නැතිවේ.

රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ,
විශේෂ කොමසාරිස් තැන.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
ප්‍රකාශන අංශය,
තැ. පෙ. 520, කොළඹ 7.

**රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුමේ ප්‍රකාශන අංශයේ සිංහල/දෙමළ භාෂා පරිවර්තක ධුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

1. සම්පූර්ණ නම :———. (අ) අගට යෙදෙන නම් :————.
(පැහැදිලි ලොකු අකුරින්) (ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. (ආ) : ————. වැනි දිනට නිවැරදි වයස :————.
වර්ෂ :——— මාස ——දින :———.
(ආ) උපන් ස්ථානය හා දිනය :————.

උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි.

4. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙළ :————.

5. උපන් ස්ථානය :————.
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ :————.
(ඉ) ඉල්ලුම්කරුගේ සීයාගේ :————.
(ඊ) ඉල්ලුම්කරුගේ සීයාගේ පියාගේ :————.

6. ඉල්ලුම්කරු විවාහකද ? අවිවාහකද ? එසේ නැත් නම් විවාහයෙන් පසු පුරුෂයා හෝ භාර්යාව මැරුණු අයෙක් ද ? විවාහක නම් විවාහ වූ දිනය හා දරුවන් ගණන :————.

7. ඉගෙනීම කළ පාඨශාලා හා විද්‍යාලයවල නම් :————.
(ඇතුළත් වූ දිනය හා අස් වූ දිනය සඳහන් කළ යුතුයි).
(අ) සාමාන්‍ය අධ්‍යයනය :————.
(ආ) වෘත්තීය අධ්‍යයනය :————.

8. ශාස්ත්‍රීය අධ්‍යයනය හා/හෝ වෘත්තීය අධ්‍යයනය සම්බන්ධයෙන් සුදුසුකම් : (මේ සුදුසුකම් ලැබූ දිනයන් ද, විභාග ආදියකදී සමර්ථතාව දක්වූ විෂයයන් ද, ඒවායින් ලැබූ පන්තිය ද අවශ්‍ය නම් සඳහන් කළ යුතුයි. ඉල්ලුම්කරුගේ ශාස්ත්‍රඥානය හා වෘත්තීය ඥානය සම්බන්ධයෙන් ලබා තිබෙන උසස්ම සහතිකවල පිටපත් මේ සමග එවිය යුතුයි).

9. (අ) සිංහල/දෙමළ :————.
(ආ) විද්‍යා විෂයයන් යන කරුණු සම්බන්ධයෙන් ලබා තිබෙන උසස්ම සුදුසුකම් :————.

මේ සම්බන්ධයෙන් තිබෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

10. පරිවර්තන සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ දැනීමද, කෘතහස්තතාවද පිළිබඳ සම්පූර්ණ විස්තර : (ස්වශක්තියෙන්ම ලියන ලද්දවූ හෝ පරිවර්තනය කරන ලද්දවූ හෝ කිසියම් දෙයක් වේ නම් ඒ පිළිබඳ විස්තර දින දතම සහිතව සඳහන් කටයුතුයි.) 3 (ඉ) පරිච්ඡේදයේ 2 කොටස බලන්න.

11. පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර හා පත් වූ හා අස් වූ දින ද, ලැබූ වේතනය ආදියෙහි විස්තර :————.

12. විශේෂ සුදුසුකම් හෝ පුහුණුවීම්, එසේ නැත හොත් මේ සඳහා කිවහැකි වෙනත් කාරණ පිළිබඳ විස්තර :————.

13. අයදුම්කරු සම්බන්ධයෙන් වගකිව හැකි ඥාතීන් නොවන තුන් දෙනකුන්ගේ නම්, තරාතිරම් හා ලිපිනය : (මේ අය පෞද්ගලික ජීවිතයෙහි අයදුම්කරු හොඳින් දන්නා අඳුනන අය විය යුතු යි. රාජ්‍ය සේවායෙහි නියුක්ත වුවත් සම්බන්ධයෙන් මෙය අනවශ්‍ය ය.)

14. වෙනත් කරුණු :—

මේ අයදුම් පත්‍රයෙහි සඳහන් කොට තිබෙන සියලුම විස්තර නිවැරදි, සත්‍ය කරුණු බව මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. යම් හෙයකින් මෙහි සඳහන් කිසිවක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ ඔප්පු වුව හොත් මේ පදවියට මා පත්වීමට නුසුදුස්සකු වන බව හා පත්වීමෙන් පසුව ඉහත කී කරුණුවල අසත්‍යතාවක් ඔප්පු වුව හොත් කිසිම වන්දියට මා අහිමිවී පදවියෙන් පහකර දමනු ලැබීමට ද හේතුවන බව හොඳාකාර දන්නා බවද, ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

**ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරි තනතුරු**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරි තනතුරු සඳහා ඇබෑර්තු දෙකකට ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. පහත දක්වෙන ආකෘතිපත්‍රය අනුව පිළියෙළ කරගත් ඉල්ලුම්පත්‍ර අපේක්ෂකයින් විසින් තම අත් අකුරින්ම පුරවා “ බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9 ” යන ලිපිනයට 1958 දෙසැම්බර් මස 9 වැනි දිනට හෝ ඊට ප්‍රථම එවිය යුතුයි. පිළියෙළ කරන ලද ඉල්ලුම් පත්‍ර සපයනු නො ලැබේ.

ස.ල. :—ඉල්ලුම් පත්‍ර බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ “ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් කිරීම” යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණ වග දැනුම් දෙනු නො ලැබේ.

2. **වැටුප් ක්‍රමය සහ දීමනා.**—මෙම තනතුරු සඳහා රු. 3,900 න් පටන් ගෙන රු. 180 බැගින් රු 5,340 දක්වා නඟින වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය. ගෙවල් කුලී සහ ජීවනාධාර රජයේ නියමිත ගණන් අනුව ගෙවනු ඇත.

3. **සේවයේ කොන්දේසි :—**

(අ) මෙම තනතුරු ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් රහිතය. රජයේ සේවකයින්ගේ අර්ථසාධක අරමුදලට දායක විය යුතුයි ;

(ආ) පත්වීම් දෙනු ලබන්නේ තුන් අවුරුදු පරීක්ෂණ කාල පරිච්ඡේදයකට යටත් කොටය ;

(ඇ) තවදුරටත් සේවයේ යෙදවීමට නුසුදුසු යයි හැඟේ නම් පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළතදී කිසිම හේතුවක් ප්‍රකාශ නොකොට පත්වීම් අවලංගු කිරීමට බන්ධනාගාර කොමසාරිස්ට බලය ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :**—සෑම අපේක්ෂකයෙක්ම තමන්ට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ලාංකිකයෙකු විය යුතුයි ;

(ආ) වයස අවුරුදු 24ට නො අඩු සහ 36 ට නො වැඩි විය යුතුයි ;

(ඇ) පිළිගත් සරසවියක අන්තර් පරීක්ෂණයෙන් හෝ ලක් සරසවියේ කලා හෝ විද්‍යා පිළිබඳ ප්‍රථම පරීක්ෂණයෙන් සාමාර්ථය,

**හෝ**

සම්මාන හතරක් ඇතිව ජ්‍යෙෂ්ඨයෙන් සාමාර්ථය සහ රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක ශුභ සාධක වැඩ පිළිබඳ අවුරුදු පහක පළපුරුද්ද හෝ අවුරුදු පහක ඉගැන්වීමේ පළපුරුද්ද තිබිය යුතුයි ;

(ඈ) හොඳ ශරීරයකින් යුතු විය යුතුයි. අඩුම උස අඩි 5 අඟල් 4 සහ සාමාන්‍ය පපුවේ මහත අඟල් 32 විය යුතුයි.

ස.ල. :—සමාජ සේවා වැඩ පිළිබඳ සුදුසුකම් හෝ පළපුරුද්ද ඇති අපේක්ෂකයින් ගැන විශේෂයෙන් සළකා බලනු ලැබේ.

5. අපේක්ෂකයින් විසින් තම ඉල්ලුම්පත්‍ර වලට පහත සඳහන් සහතික වල පිටපත් ඇමිණිය යුතුයි. මුල් සහතික එවීම අනවශ්‍යය :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඇ) ළඟදී ලබාගත් චරිත සහතික තුනක්.

6. ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදය ආරම්භයේ එන රාජ්‍ය භාෂාවේ තනතුරු වලට අදාළ වන පොදු කොන්දේසි බලනු මැනැවි. සියළු අයුරින්ම මෙම නිවේදනයේ ප්‍රකාර නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

වී. ඇන්. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්.

1958 නොවැම්බර් 18 වැනිද,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේදී ය.

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ශුභ සාධක නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම් කිරීම**

(ඉල්ලුම් පත්‍රය සමග එවිය යුත්තේ සහතික වල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන මුල් සහතික පිළිබඳව වගකීම දෙපාර්තමේන්තුව භාර නො ගන්නා අතර ඒවා ආපසු එවීමටද බැඳී නොසිටී.)

(1) සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරින්)

(2) ස්ථිර ලිපිනය :————.

(3) උපන් දිනය සහ 1958.12.9 දිනට වයස :————.

(4) (අ) ඉල්ලුම්කරුගේ උපන් ස්ථානය :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියාගේ උපන් ස්ථානය :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා උපන් ස්ථානය :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා උපන් ස්ථානය :————.

(5) ජාතිය :————.

(6) කසාද බැඳලා ද නැද්ද යන වග :————.

(7) උස සහ පපුවේ මහත පිළිබඳ විස්තර—

(අ) උස :————.

(ආ) පපුවේ මහත :————.

(8) අධ්‍යාපනික සුදුසුකම් :————.

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

(9) ක්‍රීඩා සහ මල්ලව ක්‍රීඩා පිළිබඳ යම් සුදුසුකමක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර සහ ආරක්ෂක හමුදාවේ හෝ ස්වෙච්ඡා සේවක හමුදාවේ හෝ සේවයක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර (සහතික පිටපත් ඇමිණිය යුතුයි) :————.

(10) ඔබ සරඹ ක්‍රීඩා පිළිබඳ හෝ ශරීර ව්‍යායාම පිළිබඳ හෝ අභ්‍යාස පංතියක් අනුගමනය කළා නම් ලබා ඇති දැනුම පිළිබඳ විස්තර සපයනු :————.

(11) සමාජ සේවා වැඩ පිළිබඳ සුදුසුකම් හෝ පළපුරුද්ද (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි) :————.

(12) දැනට රැකියාවක් ඇතොත්, ඒ කුමක්ද යන වග :————.

(13) චරිත සහතික එවනු ලබන්නේ කාගෙන්ද යන වග සහ ඔවුන්ගේ ලිපිනයන් :————.

(14) පාසලින් අස්වූදා සිට කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර : (ස්වාමියාගේ නමත්, කොතෙක් කල් සේවය කළේද යන වගත් සඳහන් කරනු. අපේක්ෂකයා රජයේ සේවයේ සිටියේ නම් හෝ දැනට රජයේ සේවයේ යෙදී සිටී නම් හෝ ඒ පිළිබඳ විස්තර සැපැයිය යුතුයි) :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### දෙවන ශ්‍රෙණියේ ගොවිජනපද භාර නිලධාරි තනතුරු

දෙවන ශ්‍රෙණියේ ගොවි ජනපද භාර නිලධාරි තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් හා දීමනාවන් හා සේවය පිළිබඳ කොන්දේසි.**—මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 1,380න් පටන් ගෙන වර්ෂයකට රු. 120 බැගින් වැඩිවී රු. 3,780 තෙක් නගී. රජයේ රෙගුලාසි අනුව ජීවන වියදම සහ ගෙවල් කුලී ගෙවනු ලැබේ.

3. **අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්.**—අයදුම්කරුවෝ වයස අවුරුදු 20ටත් 30ටත් අතර ලාංකිකයෝ විය යුත්තාහ. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට වයස සීමාවක් නැත.

අයදුම්කරුවෝ—

(අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථය, සහ

(ආ) (i) පේරාදෙණියේ කෘෂිකර්ම විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර ලද්දවුන්, හෝ

(ii) 1943 අංක 2 දරණ ආහාර නිෂ්පාදන (වතු) ආඥා පනත යටතේ පරීක්ෂකයෙකු වශයෙන් හෝ ආහාර නිෂ්පාදන නිලධාරියෙකු වශයෙන් හෝ අළුත් රබර් වැවීමේ ව්‍යාපාරය යටතේ දිස්ත්‍රික්කයක් හෝ තලාවක් භාර නිලධාරියෙකු වශයෙන් හෝ කෘෂිකර්ම කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති අය හෝ තේ, රබර් හෝ පොල් වැවීම සම්බන්ධයෙන් අක්කර 100 කට නොඅඩු වත්තක අවුරුදු 3ක පළපුරුද්දක් ඇති අය විය යුතුය.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—මෙම පත්වීම අවුරුදු 3ක පරීක්ෂණාත්මක කාලයකට යටත්ය.

(අ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් තනතුරුවලට පත් කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් මෝටර් බයිසිකලයක් වැනි අනුමත කරන ලද වාහනයක් සපයා ගත යුතුය. රජයේ මුදල් රෙගුලාසි අනුව ඔවුන්ට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(ඇ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් රු. 1,500ක ඇපයක් තැබීමට සූදානම් විය යුතුය.

(ඈ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දැනට පනවා ඇති නීති හා මින්මතු පණවන නීතිවලට ද විශෙෂයෙන් 1956 අංක 33 දරණ රජයේ භාෂා පණතේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ නීති වලට ද තෝරාගනු ලැබූ අපේක්ෂකයින් බැඳී සිටිය යුතුය.

5. තම චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

6. නියමිත පෝර්මය අනුව පිළියෙල කරන ලද අයදුම් පත් 1958 දෙසැම්බර් මස 6 වැනි දිනට හෝ ඊට පෙර "ඉඩම් කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ" කියා මෙම කාර්යාලයට එවිය යුතුය. නියමිත පෝර්මයට අනුව පිළියෙල නොකළ අයදුම් පත් භාරගනු නොලැබේ.

7. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළවූ ද රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත් කිරීම් වලට අදාළ වූ ද පොදු කොන්දේසි බලන ලෙස ඉල්ලමි.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

1958 නොවැම්බර් 13 වැනි දින,
කොළඹදීය.

### ආකෘති පත්‍රය

#### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව—ගොවි ජනපද භාර නිලධාරි තනතුරු

1. සම්පූර්ණ නම, ජාතිය සහ ලිපිනය :————.

2. * උපන් දිනය සහ උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මී මුත්තාගේ :————.

3. අධ්‍යාපනික සුදුසුකම්, සමර්ථ වූ දිනය සහිතව :————. (සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුය)

4. පාඨශාලාවෙන් අස්වූ දින සිට කරන ලද රක්ෂාවල් පිළිබඳ සම්පූර්ණ විස්තර සහිතව දැනට ලැබෙන වේතනය හා වැටුප් ක්‍රමය :————.

5. කෘෂිකර්ම කටයුතු පිළිබඳ ප්‍රායෝගිය පළපුරුද්ද :————. (වත්තෙහි බිම් ප්‍රමාණය සඳහන් කළ යුතුය)

6. යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.

7. අමුණා ඇති සහතිකවල ගණන :————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමක් ඇත්තවුන් දෙදෙනකුගේ නම් සහ ලිපිනයත්, ඔවුන්ගේ තනතුරුත් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

* අයදුම්කරු ලංකාවේ ඉපදුනි නම් (අ) සමග (ආ) හා (ඇ) දෙකම පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවේ නොඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) දෙක හෝ (ඇ) හා (ඈ) දෙකම පිරවිය යුතුය.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### දෙවැනි පෙළ ඉඩම් සංවර්ධන ඕවර්සියර්වරුන් ගේ ඇබෑර්තු

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් සංවර්ධන ඕවර්සියර්වරුන් ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

2. මෙම තනතුරු, ස්ථිර, විශ්‍රාම වැටුප් හිමි, අවශ්‍ය වුව හොත් මාරු කළ හැකි තනතුරු වේ.

3. රුපියල් 750.00 මූලික වේතනයෙකින් පටන් ගෙන, රුපියල් 42.00 ගණනේ වාර්ෂික වශයෙන් වැඩි වෙමින්, රුපියල් 1,086.00 දක්වා වැඩි වන වැටුප් ක්‍රමයක් මේ තනතුරු සඳහා නියම වී තිබේ.

4. ඉල්ලුම්කරුවන්, වයස අවුරුදු 24ට අඩු නොවූ, අවුරුදු 40 ට වැඩි නොවූ ලාංකිකයින් විය යුතු යි. "ලාංකික" යන්නෙන් හැඟෙන්නේ :—

(අ) උප්පත්තියෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසි භාවය ලබා ඇති අය හෝ

(ආ) පුරවැසි භාවය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති හෝ ඉල්ලුම් කරන්නට බලා පොරොත්තු වන, එවැනි පුරවැසි අයිතිවාසිකම්වලට හේතු සහගත අයිතියක් ඇතැයි ආරක්ෂක හා විදෙශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් සලකන අය හෝ වේ.

5. ඉල්ලුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු යි :—

(අ) විෂයයක් හැටියට සිංහල හෝ දෙමළ සමග ඉංග්‍රීසි කණිෂ්ඨ විභාගයෙන් හෝ ඊට සමාන විභාගයෙකින් සමත් වීම හෝ

(ආ) ඉංග්‍රීසියෙන් වැඩ කිරීමට දැනුමක් ඇති, සිංහල හෝ දෙමළ කණිෂ්ඨ විභාගයෙන් සමත් වීම සහ

(ඇ) ගොවිකම් පුහුණුවීමේ පාසලකින් සහතික පත් හෝ ආහාර නිෂ්පාදන ඕවර්සියර් කෙනකු හැටියට දෙවර්ෂයක සේවය තිබීම

6. පත්වීම, අවුරුදු තුනක ආධුනික කාලයකට භාජන වේ තෝරා ගනු ලබන අය ලංකාවේ ඕනෑම පළාතකට පත්කළ හැක. සවකීය රාජකාරි කටයුතු සඳහා, අනුමත කරන ලද සුදුසු වාහනයක් තබා ගැනීමට පත්වන අයට සිදු වේ. රජයේ මුදල් ව්‍යවස්ථා යටතේ ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

7. නියෝග කළ විටෙක දී, රජයෙන් අනුමත කරන ලද ඇප මුදලක් තැබීමට ඔවුන් සූදානම් වී සිටිය යුතු යි.

8. චරිතය පිළිබඳ ළඟ දී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් සමග, ඉල්ලුම්කරු ගේ සම්පූර්ණ නම, ලිපිනය, වයස, අධ්‍යාපනය හා ගොවිකම් පිළිබඳ ලබා ඇති සුදුසුකම්, ගොවිකම් පුහුණුව හා පළපුරුද්ද, දැනට කරන රක්ෂාව හා ලබන වේතනය යන කරුණු පහත සඳහන් ප්‍රකාර ඉල්ලුම් පත්‍රයක අඩංගු කර එවිය යුතු යි.

9. සෑම ඉල්ලුම් පත්‍රයක් ම මාතර දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙත, වර්ෂ 1958 ක් වූ දෙසැම්බර් මස 12 වැනි දනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු යි.

එල්. එන්. ද එල්. බණ්ඩාරනායක,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1858. 11. 13 වැනි දින,
මාතර දිසාපති කාර්යාලයේ දී ය.

**ඉඩම් සංවර්ධන ඕවර්සියර් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————.

(4) ලාංකිකයකු වූයේ කෙසේ ද :————.

(5) ඉගෙනීම පිළිබඳ ලබා ඇති සුදුසුකම් :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

(6) ගොවිකම පිළිබඳ ලබා ඇති සුදුසුකම් :————.

(7) (අ) දැනට කරන රක්ෂාව :————

(ආ) වේතනය :————.

(8) චරිතය පිළිබඳ සහතික දී ඇති අය ගේ නම් සහ ලිපින :

(අ) :————.

(ආ) :————.

(9) ගොවිකම පිළිබඳ ලබා ඇති පළපුරුද්ද :————.

(10) වෙනත් සුදුසුකම් :————.

ඉහත සඳහන් කරුණු නිවැරදි බව මම මෙයින් ප්‍රකාශ කරමි. මගේ උප්පැන්න සහතිකයේ ද, චරිත සහතික දෙකක ද පිටපත් මේ සමග එවා ඇත.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/60/4 (ජී).

**ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—පෙබරවාරි 1957**

1958 ජූනි මස 20 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 ජූනි මස 17 වැනි දින දරණ නිවේදනය හා සම්බන්ධයි. 1957 පෙබරවාරි මස පවත්වන්නට යෙදුනු ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම සඳහන් අපෙක්ෂිකාවද ටයිප් ගසන්නන්ගේ සේවයට පත්කර ගැනීමට තෝරා ගනු ලැබූ බව මෙයින් දනුම් දෙමි :—

| නම | ලිපිනය |
|---|---|
| පෙරේරා, පී. ජී. එස්. (මෙනවිය) | 49, ශාන්ත බ්‍රිජට් පටුමාවත, මෝදර, කොළඹ 15. |

2. මෙම අපෙක්ෂිකාවගේ පත්වීම අවුරුදු තුනක පරීක්ෂණ කාල සීමාවකට යටත්වනු ඇත. ඇය ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇත්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්ෂණයකින්ද සාමාර්ථය ලැබිය යුතුයි. තවද, ඇය ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසි වලටද යටත් වනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1958 නොවැම්බර් මස 18 දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේදීය.

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

**රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව**

**ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් 1959 ජනවාරි 27 වැනි දින පෙරවරු 10 දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට වෛද්‍ය උපකරණ (ටැන්ඩර් අංකය 194) සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ, පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටැන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටැන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන, පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1958 නොවැම්බර් 18 වැනි දින,
කොළඹ.

**රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව**

**ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)**

ආහාර හා කෘෂිකම් අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින්, 1959 ජනවාරි 27 වැනි දින පෙරවරු 9.30 දක්වා කෘෂිකම් දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

| ද්‍රව්‍යය | ටැන්ඩර් අංකය |
|---|---|
| (1) අම්ලකර කපන යන්ත්‍ර | ICA — 193 |
| (2) ටොන් 5 විරක් රථයක් | ICA — 195 |
| (3) ප්‍රක්ෂේපක හා තිරවැට ආදිය | ICA — 196 |
| (4) "හෙල්ව් හැමර් හා පවර් ප්‍රෙස්" (Helve Hamer & Power Press) | ICA — 197 |

කොළඹ, පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටැන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටැන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන, පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1958 නොවැම්බර් 18 වැනි දින,
කොළඹ.

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA) ටැන්ඩර්

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් 1959 ජනවාරි 27 වැනි දින පෙරවරු 10 දක්වා වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවලට ඩීසල් බලයෙන් ක්‍රියා කරන රෝද සහිත ට්‍රැක්ටර් යන්ත්‍ර (ටැන්ඩර් අංක ICA/DLF—14) සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ, පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටැන්ඩර් ෆෝර්ම ලබා ගත හැක. ටැන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට පෙර ටැන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන, පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1958 නොවැම්බර් 18 වැනි දින,
කොළඹ.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### බනලේගොඩ සංචාරක නිවාසයට විද්‍යුද් ජනක යන්ත්‍ර සැපයීම

කොළඹ යූනියන් ප්‍රදේශයේ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1958. 12. 24 වැනි දින සවස 2.30 දක්වා පහත සවිස්තර වන ඩීසල් ඇන්ජින් යන්ත්‍ර සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

මිනිත්තුවකට පරිභ්‍රමණ 1,000 කට නො අඩු වේගයකින් ක්‍රියා කරන, කලා 3 තේ, වෝල්ට් 230/400 චක්‍ර 50 හෝ, කෙළින්ම ප්‍රත්‍යාවර්තයකට සම්බන්ධ වී ඇති වෝල්ට් පාලනය කරනු ලබන යන්ත්‍රයට සම්බන්ධකම් ඇති අතර එයට ත්‍රිත්ව ක්‍රියාකාරිත්වයෙන් යුතු ඇම්ටරයක්ද, මෙම ඉංග්‍රීසි පරිවර්තනයේ ඇති අනිකුත් මානක යන්ත්‍රයන්ද සමන්විත සුවිච් බෝඩ් එකකින් සමන්විත විය යුතු යි.

2. පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතු යි. සියළු ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක්ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති මහතා, ටෙන්ඩර් පත්‍ර මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, කොළඹ 2" එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "ඩීසල් ඇන්ජින් යන්ත්‍ර සැපයීම සඳහා ටෙන්ඩරයයි" යන්න ලියා එවිය යුතු යි.

3. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර පෙට්ටියට දැමිය යුතු යි. එසේ නැතිනම් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට බලය ඇති නිලධාරියා වන "කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, කොළඹ 2" (ටෙන්ඩර් සම්බන්ධව කටයුතු කරන ලිපිකාර තැනට) ඒවා අතින්ම බාර දිය යුතු යි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "ඩීසල් යන්ත්‍ර සැපයීම සඳහා ටෙන්ඩරයයි" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතු යි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නො ලැබුණොත් ඔහු කොළඹ 2, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන වහාම විමසිය යුතු යි. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතු යි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. ටෙන්ඩරපත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර කරුවන්ට උවමනා නම් යම් ටෙන්ඩරකරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර පත්‍රයක අනුපිටපත සෝදිසි කිරීමට ඉඩ දෙනු ලැබේ. මෙය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටෙන්ඩරපත්‍ර මණ්ඩලයේ සභාපති තැන සමඟ පිළියෙල කරගත යුතුයි.

6. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර පත්‍රයක් වෙනුවෙන් රුපියල් 75 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විටය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරනු ලැබූ ටෙන්ඩරකරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බැව් දන්වා දින දහයක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

7. නියමිත ෆෝරමයේ ලියා නැති, නැතහොත් එහි කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නැති කිසිම ටෙන්ඩරපත්‍රයක්, ටෙන්ඩරපත්‍රයක් ලෙස සළකනු නොලැබේ. ටෙන්ඩර ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩරකරුගේ කෙටි අත්සන තැබිය යුතුද වේ. ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉල්ලන මුදල් ගණන අකුරෙනුත් ඉලක්කමෙනුත් ලිවිය යුතුයි. මිල සඳහන් කළ යුත්තේ රේගු ගාස්තු රහිත කොළඹදී දුම්රිය පෙට්ටිවලට පැටවීමට යන ගණන්ය.

8. පුළුවන්කමක් තිබේ නම් ටෙන්ඩර්කරුවන් ඔවුන් විසින් ටෙන්ඩර් කරණු ලබන දේ සම්බන්ධයෙන් ක්‍රියාකරන්නාගේ අත් පොත (Operator's Handbook) වැඩපළ සංග්‍රහය (Work-shop Mannual) සහ යන්ත්‍රෝපකරණවල වැඩිපුර උවමනා කරන කොටස් වල මිළ ගණන් සඳහන් ලැයිස්තුවක්ද (Priced spare parts list) සැපයිය යුතුයි. ටෙන්ඩර්කරුවන් විසින් සාදන්නාගේ සහතික කරනු ලබන කාලය සහ නොමිලයේ සේවාකර දෙන කාලය (Period of free service) සඳහන් කළ යුතුයි.

9. ටෙන්ඩරපත්‍රයේ සඳහන්කරන සියළු මිළ ගණන් යටත් පිරිසෙයින් සති හයකටවත් වෙනස් නොවන ස්ථිර ඒවාද විය යුතුයි. සෑම ටෙන්ඩරකරුවෙකු විසින්ම ඉහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීමට හැකිවේයයි සිතන දිනය හෝ කාලය ටෙන්ඩර පත්‍රයේ සඳහන් කළ යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද යන්ත්‍රෝප කරණවල මුළු වියදමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරනු ලැබූ ටෙන්ඩරකරුවාට නියමකරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කරනු ලැබූ ටෙන්ඩරකරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කාරයින්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර පත්‍රයක් හෝ සියළු ටෙන්ඩර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත් ටෙන්ඩර පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය ආණ්ඩුව වෙත තබා ගනී.

12. ලාංකික වෙළඳුන්ට පමණක් වෙළඳාම් කිරීමට සීමා කරනලද රටවලින්, එනම් ජපානය, ජර්මනිය, චීනය, ඇල්බේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චැකොස්ලොවේකියාව, එස්තෝනියාව, හන්ගේරියාව, ලැට්වියාව, ලිතුවේනියාව, පෝලන්තය, රුමේනියාව, ස්පාඤ්ඤය, රුසියාව සහ යුගෝස්ලේවියාව ආදී රටවලින් බඩු ගෙන්වා සැපයීමට අදහස්කරන ටෙන්ඩරකරුවන් බඩු ගෙන්වීමේ පාලක නිලධාරිතැනගේ සාමාන්‍ය බඩු ගෙන්වීමේ බලපත්‍රයක් ලත් ලාංකික වෙළෙන්දන් විය යුතුයි.

13. පත්කරනු ලැබූ ටෙන්ඩරකරුවා විසින් ටෙන්ඩරපත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් පමණක් ගතයුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

14. 1934රේ 19 වැනි කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම්කිසි කම් කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමට බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

16. කොන්ත්‍රාත්කරුවාට භාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු කියා ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත්, නැතහොත් ඒ ලිපිනයේ ඇති ස්ථානයේ ගෙනගොස් තැබුව හොත් ඔහු අතටම භාරදුන්නා කොට සලකනු ලැබේ.

17. කෘෂිකර්ම අධ්‍යක්ෂතැනට උවමනායයි පෙනී ගියොත් පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ඇපකරුවෙක් හෝ ඊට වැඩි ගණනක් සොයාගෙන ඔහුගේ වියදමින්ම ඔවුන් ලවා පොරොන්දු ඔප්පුවක් අත්සන් කිරීමට සූදානම්විය යුතුයි. මේ ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන ලවා අනුමත කළ යුතුයි.

18. වැඩ පැහැරහැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

8. නියමිත ෆෝර්මයෙහි ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණය සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් සලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් කිසිම වෙනසක් සිදුකළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන ද තැබිය යුතුය.

9. සම්පූර්ණ ටෙන්ඩරය හෝ එහි කොටසක් භාර ගැනීමේ හෝ නොගැනීමේ බලය රජය විසින් තබාගනු ලැබේ.

10. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළුම දැනුම්දීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සපයන ලද ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැව්වහොත් ඔහුට භාරදුන්නා ලෙස සැලකිය යුතුය.

11. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනකු සමග හෝ නම ඇතුළත් වූ කිසිවෙකුගේ ටෙන්ඩර් පත්‍රයක් භාරගනු නොලැබේ.

12. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ දින සිට සති 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් එම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජනය කිරීමට ඉඩ තැබිය යුතුය.

13. ටෙන්ඩර්කරු තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

14. අනුරාධපුර කෘෂිකම් කායඝිලයේදී මෙම ලොරිය පරීක්‍ෂා කර බැලිය හැකිය.

15. වැඩි විස්තර ලබා ගැනීමට අවශ්‍ය නම් අනුරාධපුර කෘෂිකම් කායඝිලයේ පරිපාලක නිලධාරි තැනගෙන් විමසන්න. එසේ එවන ලියුම් ඔහුගේ පුද්ගලික ලිපිනයට නොලිවිය යුතුය.

එම්. එෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්‍ෂ.

පේරාදෙණිය, 1958.11.15.

---

## වාරිමාගී දෙපාර්තමේන්තුව

අත්තනගලු ඔය යෝජනා ක්‍රමයට අයත් (අ) ගල්වැටිය අමුණ, (ආ) මාඹිට අමුණ, (ඇ) කොළඹ දිස්ත්‍රික්කයේ ගල්කන්ද අමුණ, තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රුපියල් 41,000, රුපියල් 40,000 සහ රුපියල් 26,000 හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි කළ කොන්ත්‍රාත්කරුවන්ගෙන්, 1958 දෙසැම්බර් මස 3 වැනි බදාදා පෙරවරු 11.30 දක්වා කොළඹ කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශයේ ප්‍රාදේශිය වාරිමාගී ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50 මෙම කායඝිලයෙහි හෝ ඕනෑම දිසාපති කායඝිලයක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළවිට 1958 නොවැම්බර් මස 29 වැනි සෙනසුරාදා පස්වරු 1 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරණු ලැබේ.

වැඩි විස්තර පහත සඳහන් මගෙන් ලබාගත හැක.

වාරිමාගී ඉංජිනේරු තැන.
අත්තනගලු යෝජනා ක්‍රමය.

වාරිමාගී කායඝිලය,
ගම්පහ. 11. 11. 58.

---

## වාරිමාගී දෙපාතීමේන්තුව

ත්‍රිකුණාමලේ කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාගී ඉංජිනේරුතුමා, ඔරිස් හිල්, ත්‍රිකුණාමලය විසින් අල්ලෙයි වාරිමාගී ව්‍යාපාරයේ කල්ලාර්හි වාරිමාගී ඉන්ජිනේරුතුමාගේ පහත සඳහන් ස්ථාවර ගොඩනැගිලි දෙකක් තැනීමට ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ :—

(i) වාරිමාගී ඉංජිනේරුතුමාගේ බඩු ගබඩාවක් තැනීම.

(ii) වාරිමාගී ඉංජිනේරුතුමාගේ කායඝිලය තැනීම.

2. (i) සඳහා රු. 10,000ට හා ඊට වැඩියෙන් ලියාපදිංචි කරන ලද සහ (ii) සඳහා රු. 23,500ට හා ඊට වැඩියෙන් ලියාපදිංචි කරන ලද මෙම දෙපාතීමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර 9.12,58 දින පූ. භා. 9.30 දක්වා භාරගනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම කොළ හා අනිකුත් සියලු විස්තර අල්ලෙයි වාරිමාගී ව්‍යාපාරයේ කල්ලාර් කිලිවෙඩ්ඩිහි වාරිමාගී ඉංජිනේරුතුමාගෙන් 6.12.58 දින දහවල් 12 වන තෙක් ලබාගත හැක. ගොඩනැගිල්ලේ සැලැස්මද මෙහිදී බැලිය හැකිය.

4. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් ඉදිරිපත් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට පෙර මෙම කායඝිලයේ හෝ අන්‍ය කච්චේරියක රු. 25 තැන්පත් කළ බවට සුදුසු කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. දැනට රජයේ වැඩ ලබා ඇති කොන්ත්‍රාත්කරුවන් තමාගේ වැඩ බලන නිලධාරියාගෙන් වැඩ සතුටුදායක බවට ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍රිකා සමග ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන්නේ ත්‍රිකුණාමලේ ප්‍රාදේශික වාරිමාගී ඉන්ජිනේරු තුමාගේ කායඝිලයේ 9.12.58 දින පූ. භා. 10ටය.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### කුරක්කන් සහ හාල් ඇඹරීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ බොරැල්ලේ පිහිටි මුළුතැන්ගෙයට, 1959.1.1 වැනි දින සිට 1959ක්වූ ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ, කුරක්කන් සහ හාල් ඇඹරීම (පිටි කිරීම) පිණිස, ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ කොටුවේ, චැතැම් වීථියේ අංක 62 දරණ ස්ථානයේ අලෙවි කිරීමේ කොමසාරිස් තැන විසින් 1958ක්වූ දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම හෝ වැඩි විස්තර ඉහත සඳහන් නිලධාරි තැනගේ කායඝිලයෙන් 1958.12.12 වැනි දින සිකුරාදා දවල් 12 වන තුරු වේ.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ සංවර්ධන කොමසාරිස් තැන වෙනුවට.

1958.11.14 වැනි දින,
අලෙවි කිරීමේ දෙපාතීමේන්තුව,
අංක 62, චැතැම් වීථිය,
කොළඹ, කොටුව.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### බොරැල්ලේ පිහිටි මුළුතැන්ගෙට කෙසෙල් කොළ සැපයීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් බොරැල්ලේ සර්පන්ටයින් පාරේ පිහිටි මුළුතැන්ගෙට 59. 1. 1 සිට 59. 12. 31 වැනි දින දක්වා කාලය තුළ මෙහි පහත සඳහන් විග අළුත් ඇති කෙසෙල් කොළ සපයා ගෙනදීම පිණිස ටැන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ කොටුවේ අංක 62 දරණ චැතැම් වීථියේ අලෙවි කිරීමේ කොමසාරිස් තැන විසින් 1958 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

කෙසෙල් කොළ :—අඟල් 12"×18" දිග පළල ඇති පුමානේ පස් දින තුළ (සඳුදා සිට සිකුරාදා දක්වා) දවසකට කෙසෙල් කොළ 3,000 බැගින් ද සෙනසුරාදා, ඉරිදා දිනවල දවසකට කෙසෙල් කොළ 2,000 බැගින් ද සපයා ගෙන දිය යුතුයි.

ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම සහ වැඩි විස්තර දැන්වීම කොළඹ කොටුවේ අංක 62 දරණ චැතැම් වීථියේ, අලෙවි කිරීමේ කොමසාරිස්තැනගේ කායඝිලයෙන්, 1958. 12. 12 වැනි සිකුරාදා දවල් 12 ට කලින් ටෙන්ඩර් ෆෝර්ම අනුපිටපතක් ද සහිතව ලබා ගත යුතුයි.

ඒ. ඩබ්ලිව්. ආර්. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් තැන වෙනුවට.

1958 නොවැම්බර් මස 14 වැනි දින,
අංක 62, චැතැම් වීදිය, කොළඹ, කොටුව.
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ (මලයි වීදිය, කොළඹ 2) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් වර්ෂ 1958 දෙසැම්බර් මස 12 වන දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සම්බන්ධයෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | වැඩෙහි විස්තර |
|---|---|
| (1) ම/කහටපිටිය රජයේ මුස්ලිම් පාසැල් පාසැල | ගොඩනැගිල්ල, ගුරු නිවාසය ආදිය |

(රුපියල් 40,000 හෝ ඉන් ඉහළ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 20,000 හෝ ඉන් ඉහළ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙනි).

සංලක්ෂ්‍යය : ම = මහනුවර දිස්ත්‍රික්කය.

එක් එක් වැඩට ඉදිරියෙන් සඳහන් කර ඇත්තේ ඒ ඒ වැඩ වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන කොන්ත්‍රාත් කරුවන් විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව සිටිය යුතු සීමාවයි. ඉහත සඳහන් සීමා ඇතුළත ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ටෙන්ඩර් පත්‍ර, වර්ෂ 1958 දෙසැම්බර් මස 11 දින පස්වරු 3.30 දක්වා, නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම සඳහා කච්චේරියේ මුදල් බැඳීමට අවශ්‍ය වවුචර මෙම කාර්යාලයෙන් ලබාගත යුතුයි. එම වවුචර ලබා ගැනීමට පෙර ලියාපදිංචි වීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට එන අය කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 100ක් තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. චැක්, මනිඕඩර් හා පෝස්ටල් ඕඩර් භාරගනු නොලැබේ.

ටෙන්ඩර් සඳහා පිළියෙල කර තිබෙන විස්තර මේ කාර්යාලයේදි බලාගත හැකිය. රෙජිස්ටර් තැපෑලෙන් ටෙන්ඩර් ඉදිරිපත් නොකරන්නේ නම් පුද්ගලිකව පැමිණ, ටෙන්ඩර් භාර ගැනීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් පත්කර සිටින සහකාර නිලධාරි තැනට එම ටෙන්ඩර් භාරදී ඔහුගෙන් එය ලැබුණ බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්යාලයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්, භාරගනු ලබන අවසාන දින සිට සති 6කට වලංගු ලෙස සලකනු ලැබේ.

ජී. එච්. බී. ඒකනායක,
මැ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්යාලය,
මහනුවර, 1958 නොවැම්බර් 17 දින දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් සභාවේ සභාපති තැන විසින් 1958 දෙසැම්බර් මස 12 වන කිවි දින පස්වරු 2.30 වන තෙක්, පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | කළයුතු වැඩය |
|---|---|
| (1) ගා/කිරිඹුර මුස්ලිම් විද්‍යාලය | වැට සහ තාප්පය සෑදීම |
| (2) ගා/මල්හරස් සුල්හිය මුස්ලිම් විද්‍යාලය | වැඩි දියුණු කිරීම |
| (3) ගා/ගොඩගම විද්‍යාලය ... | අලුත්වැඩියා කිරීම |
| (4) මා/දෙසියන්දර මහා විද්‍යාලය | ක්‍රීඩා භූමිය |
| (5) හ/නාකුලුගමුව විද්‍යාලය | බාලිකා වැඩි දියුණු කිරීම |
| (6) හ/බෙලිඅත්ත මහා විද්‍යාලය | ක්‍රීඩා භූමිය |
| (7) හ/දෙබරවැව මහා විද්‍යාලය ... | ක්‍රීඩා භූමිය |

සංලක්ෂ්‍යය : ගා = ගාලු දිස්ත්‍රික්කය
මා = මාතර දිස්ත්‍රික්කය
හ = හම්බන්තොට දිස්ත්‍රික්කය

2. ඉහත සඳහන් වැඩ වලින් අංක 1, 2 සහ 3ට රු. 7,500ට හෝ ඊට වැඩි ගණනකටද, අංක 6 සහ 7ට රු. 5,000ට හෝ ඊට වැඩි ගණනකටද, අංක 3ට රු. 3,000ට හෝ ඊට වැඩි ගණනකටද, අංක 4ට රු. 2,500ට හෝ ඊට වැඩි ගණනකටද අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි තැණීම සඳහා ලියා පදිංචිව සිටින අයට සහ අංක 1, 2 සහ 3ට රු. 15,000ට හෝ ඊට වැඩි ගණනකටද, අංක 6 සහ 7ට රු. 10,000ට හෝ ඊට වැඩි ගණනකටද, අංක 3ට රු. 6,000ට හෝ ඊට වැඩි ගණනකටද, අංක 4ට රු. 5,000ට හෝ ඊට වැඩි ගණනකට ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී සිටින අයට අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාව) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රු. 100ක ඇප මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැන වෙත ඉදිරිපත් කරන්නාවූද අයට 1958 දෙසැම්බර් මස 11 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චැක්පත්, මනිඕඩර් පෝස්ටල් ඕඩර් ආදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර, කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් (එස්. ඩබ්ලිව්. ශාඛාව) හෝ දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබා ගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරණු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණකි.

4. පූර්වෝක්ත දෙවන ඡේදයේ සඳහන් වන පරිදි දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම එවිය යුත්තේ දෙවන පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන කාර්යාලය, ගාල්ල යන ලිපිනයට, රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේ, කාර්යාල සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩේ නමද ලියා තිබිය යුතුයි.

5. 1958 දෙසැම්බර් මස 12 වන කිවි දින පස්වරු 2.30ට ගාල්ලේ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එවිට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරණු ලබන නිලධාරිතැන විසින්, ටෙන්ඩර් කරුවන්ගේ නම් ද, ප්‍රමාණයන් ද රේට් ගණන් ද පැමිණි අයට ඇසෙන්ට කියවනවා ඇත.

6. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසාන කර සති 6 කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැන ගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා, ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේශියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂකවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරණු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඇම්. බී. නූර්දීන්,
දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැන.

අධ්‍යාපන කායඞාලය,
ගාල්ල, 17. 11. 1958.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් සභාවේ සභාපති තැන විසින් 1958 දෙසැම්බර් 12 වන කිවි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. හ/දෙබරවැව මහා විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් සහ ගුරු නිවාසයක් තැනීම. |
| 2. හ/හිඟුරකන්ද විද්‍යාලය | පාසල් ගොඩනැගිල්ලක් තැනීම. |

සංලක්ෂ්‍යය.—ගා = ගාලු දිස්ත්‍රික්කය.
මා = මාතර දිස්ත්‍රික්කය.
හ = හම්බන්තොට දිස්ත්‍රික්කය.

ඉහත සඳහන් වැඩ වලින් අංක 1ට රු. 15,000කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 2කට රු. 13,000කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි තැනීමට ලියා පදිංචි වී සිටින අයට සහ අංක 1ට රු. 30,000කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 2ට රු. 26,000කට හෝ ඊට වැඩි ගණනකටද, ප්‍රසිඩ වැඩ දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචිව සිටින අයට අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කායඞාලයේ ඒ සී. ශාඛාව හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රු. 100ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරි තැන වෙත

4. වර්ෂ 1958ක් වූ දෙසැම්බර් මස 17 වන දින පූ. භා. 10 ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ගේ කාර්‍යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

1958ක් වූ නොවැම්බර් මස 21 වන දින,
තැ. පෙ. 540, කොළඹ.

---

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**රාගම පිහිටි උතුරු කොළඹ ආරෝග්‍යශාලාවේ ශල්‍යාගාරවලට, සිහිනැති කරන කාමරවලට සහ විෂ බීජ නාශක කාමරවලට වායු සමන යන්ත්‍ර සැපයීමේ සහ සවි කිරීමේ ටෙන්ඩර් සම්බන්ධවයි**

1. ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1958ක් වූ දෙසැම්බර් මස 24 වන බදාදා පූ. භා. 9.30 දක්වා ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාල යෙහිදී කියවා බලාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5යේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් ෆෝර්ම වලයි. වර්ෂ 1958 ක් වූ දෙසැම්බර් මස 19 වන දින වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1958 ක් වූ දෙසැම්බර් මස 24 වන දින අ. භා. 2.30ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

තැ. පෙ. 540,
කොළඹ,
1958ක් වූ නොවැම්බර් මස 21 වන දින දීය.

---

## ලුණු දෙපාර්තමේන්තුව

පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටි පුත්තලමේ නැගෙනහිර ලුණු ලේවාය, පුත්තලමේ බස්නාහිර ලුණු ලේවාය, නාච්චිකල්ලි ලුණු ලේවාය, කරතිව් ලුණු ලේවාය, සහ කල්පිටි ලුණු ලේවාය යන මේ ලුණු ලේවාවල කොටුවලින් හෝ ගොඩින් අසුරා තිබෙන ලුණු එමකී ලුණු ලේවාවල වේදිකාවලට පටවාගෙන යාමට ටැන්ඩර් පත්‍ර 1958 ක් වූ දෙසැම්බර් මස 12 වැනි දින සිකුරාදා පස්වරු 3 වනතුරු කොළඹ කොම්පඤ්ඤවීදියේ නො. 110, ජෙනරල්ස් ලේක් පාරේ තැපැල් පෙට්ටිය නො. 539, දරණ ලුණු කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ පුත්තලමේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ පුත්තලමේ ලුණු පරිපාලක තැනගෙන් ලබාගන්නා ෆෝර්ම කොලවලය. ටැන්ඩර් පත්‍ර මුදලක් වශයෙන් රු. 25ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්‍යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට ටැන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස් තැන.

1958 ක් වූ නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ.

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතුසේවා සහ මාර්ග ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1958 දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා, කොළඹ වරාය කොමිෂන් සභාවට වානේ කම්බි කඹ සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1958 දෙසැම්බර් මස 17 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාල යේදී පරීක්ෂා කළ හැක. රු. 100ක මුදලක් වරාය කොමිෂන් කාර්‍යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1958 දෙසැම්බර් මස 16 වෙනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍යවී නම් එය සැපයීමට ටෙන්ඩර් කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඩී. ජේ. දයාරත්න,
වරායේ කොමසාරිස්.

1958 නොවැම්බර් මස 11 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්‍යාලයේදීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතුසේවා සහ මාර්ග ප්‍රවාහණ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1958 දෙසැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා, කොළඹ වරාය කොමිෂන් සභාවට කාර්‍ය මණ්ඩලීය මෝටර් රථයක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1958 දෙසැම්බර් මස 17 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපිලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්‍යාල යේදී පරීක්ෂා කළ හැක. රු. 100ක මුදලක් වරාය කොමිෂන් කාර්‍යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1958 දෙසැම්බර් මස 16 වෙනි අඟහරුවාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍යවී නම් එය සැපයීමට ටෙන්ඩර් කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඩී. ජේ. දයාරත්න,
වරායේ කොමසාරිස්.

1958 නොවැම්බර් මස 11 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්‍යාලයේදීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

**දැන්වීමයි**

බ්‍රේක් තෙල් (බ්‍රේක් ෆ්ලුයිඩ්) සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට කිරුළ පාරෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1959යේ ජනවාරි මස 21 වෙනිදා වන බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර පත්‍ර නියමිත ෆෝරම කොළවල ලියා අනුපිටපතකින් ද යුක්ත කොට එවිය යුතුයි. මේ ෆෝරම කොළ, බොරලැස්ගමුවේ වේරහැර වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්‍යාලයෙන් 1959යේ ජනවාරි මස 20 වෙනිදා වන අඟහරුවාදා දවල් 12 වන තෙක් දෙනු ලැබේ.

3. ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1958වේ නොවැම්බර් මස 12 වෙනි දින,
කොළඹදීය.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### අභ්‍ය විමසි

බස් මගී ටිකට් පත්‍ර මුද්‍රණය කිරීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර තාරාහේන්පිට කිරුළ පාරෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1958වේ දෙසැම්බර් මස 17 වෙනිදා වන බදාදා පෙරවරු 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින් ද යුක්තකොට එවිය යුතුයි. මේ පෝරම කොළ, බොරලැස්ගමුවේ වේරහැර වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් 1958වේ දෙසැම්බර් මස 16 වෙනිදා වන අඟහරුවාදා දවල් 12 වන තෙක් දෙනු ලැබේ. ඒවා දෙන්නේ රු. 50/-ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ විට ය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් විස්තර දැනගත හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1958වේ නොවැම්බර් මස 17 වෙනි දින,
කොළඹදීය.

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### සේවයට අයෝග්‍ය තැපැල් වෑන්රථ සහ ටයර් මිලට ගැනීම සඳහා ටෙන්ඩර්

සේවයට අයෝග්‍ය තැපැල් වෑන්රථ සහ ටයර් මිලට ගැනීම සඳහා 1958 දෙසැම්බර් මස 19 වෙනි දින පෙරවරු 9.30 දක්වා කොළඹ ප්‍රධාන තැපැල් කාර්යාලයේ සහකාර පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

වැඩි විස්තර සඳහා මේ ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවන ඡේදයේ දැන්වීම් (ඉංග්‍රීසි) බලන්න.

එච්. ජී. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ, 1958. 11. 18.

---

## ධීවර අධිකාරිය

### මස් මරන්නන් සඳහා ගෙවල් 25ක් සහ ලිං 3ක් මඩකලපු දිස්ත්‍රික්කයේ කන්තන්කුඩියේ සෑදීම සඳහා ටෙන්ඩර

1958 ඔක්තෝම්බර් මස 17 වැනිදා අංක 11,555 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම ගැනයි.

ටෙන්ඩර් බාරගන්නා අන්තිම දිනය 1958 නොවැම්බර මස 26 වැනිදා දවල් 12 දක්වා දීර්ඝ කොට ඇත. ටෙන්ඩර් පත්‍ර 1958 නොවැම්බර් 24 වැනිදා සවස 3 දක්වා නිකුත් කරනු ලැබේ.

ඩී. ටී. ජී. ඒ. ද පොන්සේකා,
ධීවර අධිකාරී.

1958 නොවැම්බර් 13 වැනිදා,
කොළඹ ධීවර අධිකාරියේ දීය.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

මොරටුවේ වෙලෝනා කර්මාන්ත පර්යේෂණායතනයෙහි පේෂ කර්මාන්ත ශාලාවකට ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා සවදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1958 දෙසැම්බර් 19 දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර බාර ගැනෙන්නේ රු. 20,000 ට සහ ඊට වැඩි වැඩ සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණකි. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම සඳහා රු. 50 ඇප මුදලක් තැන්පත් කළ යුතුය.

ජී. වී. පී. සමරසිංහ,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත
අධ්‍යක්ෂක තැන.

1958 නොවැම්බර 18 දින,
කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රයේ දී ය.

## ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ස්ටේෂන් වැගන් රථ දෙකක් සැපයීම සඳහා කොළඹ 1, තැපැල් පෙට්ටිය 500, දරණ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි තැපැල්, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 ජනවාරි මස 13 වැනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. දෙවෙනි පිටපතකින් යුතුව ටෙන්ඩර ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 1, සෙනේට් ගොඩනැගිල්ලේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති නිලධාරිගෙන් ලබාගත හැකි පෝරමවලය.

3. 1959 ජනවාරි 12 වෙනිදා පස්වරු 2ක දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ඒ සඳහා රු. 50ක් තැන්පත් කළ බවට රිසිට්පුවක් ද ඉදිරිපත් කළ යුතුයි. මේ මුදල කොළඹ මහා භාණ්ඩාගාරයේ දී හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක දී තැන්පත් කළ හැකිය.

4. වැඩි විස්තර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ය.

ඩබ්ලිව්. ලයනල් ප්‍රනාන්දු,
වැඩ බලන ප්‍රවෘත්ති නිලධාරි.

කොළඹ 1, තැ. පෙට්ටිය 1416,
සෙනේට් ගොඩනැගිල්ලේ
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදීය.

1958 නොවැම්බර් මස 17 වැනි ද.

---

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා විසින් රත්මලේ මධ්‍යම පන්ති ව්‍යාපාරය තුළ ඇති පාරවල්වල බෝක්කු සෑදීම සඳහා ටෙන්ඩර් පත් 1958 නොවැම්බර් මස 27 වෙනි දින පෙරවරු 9 වන තෙක් භාරගනු ලැබේ. වැඩි විස්තර කුරුණෑගල කච්චේරියෙන් දැනගැනීමට පුළුවන.

ඩබ්ලිව්. එච්. ජයසිංහ,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා වෙනුවට.

කච්චේරිය,
කුරුණෑගල, 12.11.58.

---

අංක. අයි/පී. කේ. ඇස්/461/2.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුලු වාරිකර්ම වැඩ

දකුණු පිටිගල් කෝරළේ පිහිටි පහත සඳහන් සුලු වාරිකර්ම වැඩ සඳහා ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ :—

1. සිංගක්කුලිය වැවට රෙගුලේටරයක් ඉදි කිරීම.

2. කඩවල බැම්ම අලුත්වැඩියා කිරීම.

එක එක වැඩය සඳහා පුත්තලම කච්චේරියේ රුපියල් දහයක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් අමුනා වාරිකර්ම අංශයෙන් ලබාගත් ආකෘති පත්‍රවල එවන ටෙන්ඩර් පත් 1958 නොවැම්බර් මස 26 වෙනි බදාදා පෙරවරු 10 වනතුරු භාරගනු ලැබේ.

1958 නොවැම්බර් මස 24 වෙනි සඳුදා පස්වරු 3 වනතෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම එනම් 1958 නොවැම්බර් මස 26 දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඒ වේලාවේ ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විමසීමෙන් මගෙන් දැනගත හැකියි.

හෙමසිරි ප්‍රේමවර්ධන,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1958 නොවැම්බර් 13,
පුත්තලම් කච්චේරියේ දී.

---

දකුණු කොළඹ, දෙමටගොඩ ඇල හරහා පාලමක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1958වේ දෙසැම්බර් මස 24 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. රත්මලානේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ පාලම් තැනීම පිළිබඳ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

| | | | | | |
|---|---|---|---|---|---|
| කතුරු | ... | 1 | දිග මේස | ... | 1 |
| ස්පිරිට් ලාම්පු | ... | 1 | ලී බන්දේසි | ... | 1 |
| මේස හැඳි | ... | 3 | ටෝච් ලයිට් | ... | 2 |
| වේවැල් ස්ක්‍රීන් | ... | 3 | පරණ කඩදාසි (නියුස් පේපර්ස්) රාත්තල් | ... | 209 |
| ඉනැමල් බාල්දි | ... | 3 | | | |
| දිග යකඩ හැඳි | ... | 1 | අත් පුටු | ... | 1 |

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
ස්වදෙශ වෛද්‍ය ක්‍රම සංවර්ධන කොමසාරිස්.

---

# විවිධ දැන්වීම්

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

පහත දැක්වෙන සේවයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට මෙම දෙපාර්තමේන්තුව අදහස් කර ඇත :—

(අ) ගොවි ජනපදයන්හි ගොවි නිවාස තැනීම.

(ආ) ගොවි ජනපදයන්හි ආරෝග්‍යශාලා, බෙහෙත් ශාලා, රජයේ නිලධාරීන්ගේ නිවාස ආදී පොදු ගොඩනැගිලි තැනීම.

(ඇ) පස් පිරවීම, ගල් පුපුරවීම, බෝක්කු සහ කුඩා පාලම් තැනීම ආදී ඇතුළු මාර්ග තැනීම.

(ඈ) මාර්ගයන්හි ගල් අතුරවීම හා තාර දැමීම.

(ඉ) ජලය සපයාදීම හා කසල කානු තැනීමේ වැඩ.

(ඊ) කලින් පොල් අතු, ඇස්බෙස්ටෝස් තහඩු හෝ ඇළුමිනියම් තහඩු ආදියෙන් සාදන ලද ගොවි නිවාස වහල උළු සෙවිලි කිරීම.

(උ) ගොවි ජනපදයන්හි ගොවි නිවාස අළුත්වැඩියා කිරීම.

2. මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි කරවා ගැනීමට සතුටු අය නියමිත පෝර්ම කොළවල ඉල්ලුම් කළ යුතුයි. මෙම පෝර්ම කොළ, කොළඹ, ගාලුමුවදොර මහලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලෙහි, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් ඉල්ලුම් පතකින් හෝ පෞද්ගලිකව පැමිණ ලබා ගත හැකිය. ඉල්ලුම් පත්‍ර 58. 12. 22 වැනි දින හෝ ඊට ප්‍රථම ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැන වෙත ලැබෙන සේ කොළඹ, නො. 500 දරණ තැපැල් පෙට්ටියට එවිය යුතුයි.

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක.

තැපැල් පෙට්ටිය නො. 500,
මහලේකම් කාර්යාලීය ගොඩනැගිල්ල,
කොළඹ 1.

---

## කොළඹ ආඳුරුප්පු වීදියේ තනා ඇති සාප්පු ගොඩනැගිලි කුලියට දීම

කොළඹ ආඳුරුප්පු වීදියේ තනා ඇති සාප්පු ගොඩනැගිලි කුලියට දීම සඳහා 1958 දෙසැම්බර් මස 8 වැනි සඳුදා පෙරවරු 10ට ලංකා බැංකු ගොඩනැගිල්ලේ තුන්වැනි මාලයේ පිහිටි මගේ කාර්යාලයේදී වෙන්දේසියක් පැවැත්වේ.

සාප්පු ගොඩනැගිලි 5ක් ආඳුරුප්පු වීදියට මුහුණ ලා ඇති අතර සාප්පු ගොඩනැගිලි 6ක් සිරිපිනා පටුමාවතට මුහුණ ලා පිහිටා ඇත. සාප්පුවක විශාලත්වය හතරැස් අඩි 600ක් පමණ වේ. ආඳුරුප්පු වීදියට මුහුණ ලා ඇති ගොඩනැගිල්ලක මාසික කුලිය රුපියල් 150ක් වන අතර, සිරිපිනා මාවතට මුහුණ ලා ඇති ගොඩනැගිල්ලක කුලිය රුපියල් 130ක් වේ. ඉල්ලුම්කරුවකු විසින් ගෙවිය යුතු අඩුම මූලික මුදල රුපියල් 500ක් වේ.

ඒ ඒ වර්ගයට අයත් ගොඩනැගිලි සඳහා ඉහළම ගණනක ලන්සුව ඉදිරිපත් කරන අයට ඒවායේ අයිතිය පවරා දෙනු ලැබේ. ඒ ඒ වර්ගයට ගෙවිය යුතු අඩුම මූලික මුදලට වඩා පහළ ලන්සු පිළිගනු නොලැබේ. ඉල්ලුම්කරුවන් ඉදිරිපත් කරනු ලබන යම්කිසි ලන්සුවක් පිළිගැනීමට පෙර ජාතික නිවාස කොමසාරිස් ලන්සුව ඉදිරිපත් කරන ඉල්ලුම්කරුගේ නියම සුදුසුකම් ගැන හා ගොඩනැගිලි කුලියට දීමේ කොන්දේසි අනුව ක්‍රියා කිරීමට ඔහුට ඇති හැකියාව ගැන සෑහීමකට පත් විය යුතුවා පමණක් නොව වඩා අඩු ලන්සුවක් පිළිගැනීමේ අයිතියද තමන් කෙරෙහි තබාගනු ලැබේ.

තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු ඔහුගේ ලන්සුව පිළිගත් වහාම හෝ එසේ පිළිගෙන සති දෙකක් තුළදී හෝ ලන්සුවේ වටිනාකම සහ තුන් මසක කුලී ප්‍රමාණය තැන්පත් මුදලක් සේ කොමසාරිස් තුමාට ගෙවිය යුතුය. තැන්පත් කරන ලද ලන්සුවේ වටිනාකම ආපසු ගෙවනු නොලැබේ.

තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු තමන්ගේ ලන්සුවේ වටිනාකම සහ තුන්මසක කුලී ගෙවූ පසු පහත සඳහන් කොන්දේසිත් අඩංගු ගෙවල් කුලී ගිවිසුමකට අත්සන් තැබිය යුතුය :—

(අ) ජාතික නිවාස කොමසාරිස්ගෙන් ලියවිල්ලකින් ලබාගත් අනුමතිය නොමැතිව තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිලි වල පදිංචිකරුවන්වූ විට තමන්ට කුලියට දෙන ලද ගොඩනැගිල්ල වෙනත් අයකුට කුලියට දීම, විකිණීම, තෑගි කිරීම, උගස් කිරීම හෝ වෙනයම් විදියකින් ඔහුගේ අයිතිය අන් අයකුට පැවරීම නොකළ යුතුය.

(ආ) තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචිකරුවූ විට එම ගොඩනැගිල්ල සිය වියදමෙන් අළුත්වැඩියා කොට සෑම අවස්ථාවේම යථා තත්වයෙන් තබාගත යුතුවා පමණක් නොව, වරිපනම් හා අයබදුද ගෙවිය යුතුය. තමන්ට කුලියට දී ඇති ගොඩනැගිල්ල වටා තාප්පයක් හෝ වැටක් ඉදි කොට එය යථා තත්වයේ තබාගත යුතුය.

(ඇ) තෝරාගත් ඉල්ලුම්කරු ගොඩනැගිල්ලේ පදිංචියට පැමිණි පසු ඔහුට පවරා ඇති පදිංචිය හමාර වූ විට එම ගොඩනැගිල්ල ඊට සවිකර ඇති සෑම දෙයක්ම මනා තත්වයකින් අමතරව ඉදිකර ඇති ගොඩනැගිල්ල සහ වැඩි දියුණු කර ඇති කොටස්ද සමග ජාතික නිවාස කොමසාරිස් තැනට භාර දිය යුතුය. යම් අමතර කොටස් ඉදිකර ඇතොත් ඒ සඳහා කිසිම අලාභයක් පදිංචිකරුට ගෙවනු නොලැබේ.

(ඈ) අවුරුදු පහකට වරක් අවශ්‍යවුවොත් ගෙවල් කුලී සංශෝධනය කරනු ලැබේ.

මේ සම්බන්ධ වැඩි විස්තර ජාතික නිවාස කොමසාරිස් තැනගෙන් ලබාගත හැක.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

කොළඹ.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### කුලියට සින්නවීමේ ක්‍රමයේ මධ්‍යම පංති නිවාස

දැනට මෙම දෙපාර්තමේන්තුව මගින් මහනුවර, අරුප්පොල තනා නිමවී ඇති ගෙවල් සඳහා ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්කරුවන්ගේ මාසික ආදායම ඒ ඒ වර්ගයට අයත් නිවාස සඳහා මෙහි පෙන්නුම් කර ඇති ආදායම් ප්‍රමාණයට නොඅඩු විය යුතුය. 3ඒ. වර්ගයේ ගෙවල් හයක් සහ 3බී. වර්ගයේ ගෙවල් හතරක් හිස්ව ඇත.

**නිවාසයන්ගේ විස්තර :—** මෙම නිවාස පිහිටා ඇත්තේ මහනුවර නගර සභා සීමාව තුළ පිහිටි අරුප්පොල නම් ග්‍රාමයේ ය.

1. නිදන කාමර දෙකකින් යුත් 3ඒ. වර්ගයේ නිවාසයක විශාලත්වය හතරැස් අඩි 763යි. මසක ආදායම රුපියල් 300කට නොඅඩු විය යුතුය.
2. නිදන කාමර දෙකක්, අමතර ශබ්ඩා කාමරයක්, පිටුපසින් ඇති ඉස්තෝප්පුවක් සහ විශාල කෑම කාමරයක් සහ ආලින්දයක් යනාදියෙන් සමන්විත 3බී. වර්ගයේ නිවාසයක විශාලත්වය හතරැස් අඩි 1,015ක් වේ. ඉල්ලුම්කරුවන්ගේ මාසික ආදායම රුපියල් 350කට නොඅඩු විය යුතුය.

විශාලත්වයෙන් පර්චස් 17ටත් 26ටත් අතර ඇති බිම් කොටස්හි තනා ඇති මෙම නිවාස සඳහා විදුලි බලය සපයනු ලැබේ. නල මාර්ගයෙන් ජලය සැපයීමේ ස්ථිර යෝජනා ක්‍රමය ක්‍රියාවේ යොදවන තුරු තාවකාලිකව ජලය සැපයීමේ ක්‍රමයක් පිළියෙල කර දෙනු ලැබේ. වැසිකිළි කානු ක්‍රමයද පිළියෙල කොට තිබේ.

ඉල්ලුම්කරුවකු තැන්පත් කළ යුතු අඩුම තැන්පත් මුදල 3ඒ. වර්ගයේ ගෙයකට රුපියල් 200ක් සහ මසක කුලිය ද, 3බී. වර්ගයේ ගෙයකට රුපියල් 300ක් සහ මසක කුලිය ද වේ. මෙයට වඩා විශාල තැන්පත් මුදලක් ගෙවිය හැකි නම් ඊට විරුද්ධයක් නොමැත. තමන්ට ගෙවිය හැකි තැන්පත් මුදල කොපමණ දැයි ඉල්ලුම් පතේ සඳහන් කළ යුතුය.

නිවාසයක් දෙනු ලබන්නේ කුලියට සින්නවීමේ ක්‍රමය අනුවය. අයදුම්කරුවකුගෙන් ගෙයක් සඳහා මසකට අයකරනු ලබන සාමාන්‍ය මුදල පහත සඳහන් වේ :—

1. 3ඒ. වර්ගයේ ගෙයක් සඳහා රුපියල් 90යි.
2. 3බී. වර්ගයේ ගෙයක් සඳහා රුපියල් 125යි.

මහනුවර නගර සභා සීමාව තුළ වාසය කරන්නාවූ හෝ රක්ෂා වෙහි නියුක්ත අයට හෝ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

ගෙවල් අලුත්වැඩියා කිරීම සහ නඩත්තුව ඉල්ලුම්කරු විසින්ම කළ යුතුවා පමණක් නොව ගින්නෙන් පැමිණිය හැකි අලාබයක් සඳහා (ඉන්ෂුවර්) කරවා ගැනීම සහ වරිපනම් ගෙවීම් ආදියද තමන්

විසින්ම කළ යුතුය. මෙම ගෙවල් ලබාගත් පසු අනුගමනය කළ යුතු දේ සම්බන්ධිත ගිවිසුමකට කොමසාරිස් තැන හා ඉල්ලුම්කරුවන් බැඳිය යුතුය.

ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරාගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස්වරයා විසිනි. මොනම අයථා පෙළඹීමක් ඇති වුවහොත් එයම ඉල්ලුම්කරුවකු නුසුදුස්සකු වීමට කාරණයක් වන්නේ ය.

කොළඹ ජාතික නිවාස දෙපාර්තමේන්තුව මේ සඳහා පිළියෙල කර ඇති ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතු අතර එකී ඉල්ලුම් පත්‍ර 1958 දෙසැම්බර් මස 19 වන දින පස්වරු 4.30ට හෝ ඊට පෙර ජාතික නිවාස කොමසාරිස් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත එවා දින 21ක් තුළදී එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "අරුප්පොල ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1958 නොවැම්බර් 14 දින,
කොළඹ දීය.

## විශේෂ නිවේදනයයි

1958 නොවැම්බර් 25 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 නොවැම්බර් 28 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 නොවැම්බර් 24 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 නොවැම්බර් 11 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.